# අලුත් යහළුවා



ඩී.පී. වරණි දිමාගි දවටගොල්ල

# අලුත් යහළුවා

ඩී.පී. වරණි දිමාගි දවටගොල්ල

කතෘ

කතෘගේ වෙනත් කෘති
අනේ පව් පෙලිකන්

මහනුවර මහාමායා බාලිකා විදුහල
2 වසර
කෘතිය පළ කරන දිනය
2025.02.08

ISBN 978-624-208-554-8

# පිදුම

මම ගොඩාක් ආදරය කරන

මට ගොඩාක් ආදරය කරන

මගේ ආදරණිය තාත්තාට,

අම්මාට,

මගේ අත්තම්මාට සහ

මගේ ආදරණීය අක්කාට

මේ පොත මම පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **''හෙරණගත්කරණී''** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# අලුත් යහළුවා

දවසක් අපේ පන්තියට අලුතින් ළමයෙක් ආවා. අපේ ගුරුතුමිය එයාව අපට හඳුන්වලා දුන්නා. එයාගේ නම පියුමි අහිංසා වීරසේකර.අපි එයාව ආදරයෙන් පිළිගත්තා. අපි එයත් එක්ක හිනා වුණා. හැබැයි පියුමි නම් අපිත් එක්ක හිනා වුණේ නැහැ.

එදා මගේ ළඟ යහළුවෙක් හිටියේ නැති නිසා ගුරුතුමිය පියුමිට මගේ ළඟින් ඉඳගන්න කියලා කිවුවා. මම එයත් එක්ක හිනා වුණා. ඒත් එයා මට විරිත්තුවා. මාත් එක්ක හිනා වුණේ නැහැ. මම කතා කළත් එයා කතා කළෙත් නැහැ.

ඊට පස්සේ දවසෙත් එයා පාසල් ආවා. අපි එයාට ගුඩ් මෝනින් කිවුවත්, එයා අපිට ගුඩ් මෝනින් කියලා කිව්වේ නැහැ.අපෝ එයා හරිම නපුරු කෙනෙක් කියලා දයානි කිවුවා. එදත් එයා මගේ ළඟ ඉඳගත්තා. එදා පියුමි කලින් දවසට වැඩිය ටිකක් දඟ කළා.



එයා මගේ පොත් එහෙට මෙහෙට විසික් කළා. පැන්සල් විසික් කළා. යහළුවන්ගේ පොත්වල කුරුටු ගෑවා. යහළුවන් එයාට බැන්නා. එයත් යහළුවන්ට බැන්නා. මම මුකුත් කිවුවේ නැහැ. මට එයා ගැන දුකක් හිතුණා.

එයාගේ දඟ වැඩ ගුරුතුමියටත් යහළුවන් කිවුවා. ගුරුතුමිය එයාට කතා කළත්, එයා ආවේ නැහැ. කවුරුත් කියන දේවල් පොඩ්ඩක්වත් අහන්න කැමති වුණෙත් නැහැ. පියුමි අපේ පන්තියේ ඉන්න ළමයි හරිම හොඳ ළමයි. පුතත් ඒ වගේම හොඳ ළමයෙක් වෙන්න. ගුරුතුමිය නිතරම පියුමිට ආදරයෙන් අවවාද කළා.

වැඩිපුර ම පන්තියෙන් එළියේ ඉන්න තමා පියුමි කැමති. පියුමි වැරදි වැඩ ගොඩාක් කළා. ළමයින්ට කෙළ ගැහුවා, හැපුවා, කෙනෙත්තුවා, රංඩු කළා. ගුරුතුමිය නිතර එයාට අවවාද කළා වුණාට පියුමි නම් හොඳ ළමයෙක් වුණේ නෑ. දවසක් මම කෑම කනකොට මගේ කෑම පෙට්ටියට අත දාලා කෑම කෑවා. මම ඇහැවුවා “ඔයාට මගේ කෑම ඕනෙද?” කියලා. ඒත් කතා කළේ නැහැ.



අනෙක් යහළුවන් කෑම බෙදාගෙන කෑවත් පියුමිත් එක්ක කවුරුත් කෑම බෙදා ගත්තේ නැහැ.

එයා කෑම දුන්නත් කවුරුත් ගත්තෙත් නෑ. කෑවෙත් නැහැ. මට එයා ගැන ගොඩාක් දුකයි. එයාට කියලා යහළුවෝ කවුරුත් හිටියේ නැහැ.

අපි සෙල්ලම් කරන කොට එයා සෙල්ලම් කරන්න එනවා. ඒ වුණාට කවුරුත් එයාව සෙල්ලම් කරන්න ගත්තේ නැහැ. "ඔය නපුරු අයත් එක්ක සෙල්ලම් කරන්න අපි කැමති නැහැ" කියලා යාළුවෝ යනවා. යහළුවෝ කවුරුත් නැති වුණාම දුකක් ඇති වෙන නිසා මම එයත් එක්ක සෙල්ලම් කළා. මගේ අනෙක් යහළුවෝ එයත් එක්ක සෙල්ලම් කරන්න එපා කියලත් මට කියනවා.

දවසක් හයියෙන් වැස්සා. පියුමි එළියේ සෙල්ලම් කරමින් හිටියා. එයා වැටිලා සුදු ගවුමේ හොඳටම මඩ ගෑවිලා. එයා අඬ අඬා පන්තියට ආවා. අනෙක් යහළුවෝ එයාට හිනා වුණා. කවුරුත් උදවු කළේ නැහැ."නපුරි වැටිලා, නපුරිට හොඳ වැඩේ". කියලා යාළුවෝ කිවුවා.



මම එයාට එක්කරගෙන ගිහින් ඇගේ තිබුණ මඩ හෝදලා වැඩිපුර මගේ ළඟ තිබුණු සුදු ගවුමක් එයාට අඳින්න දුන්නා.

පියුමි මගෙන් ඇහුවා "ඇයි අනෙක් අය මාත් එක්ක කතා කරන්නේ නැත්තේ? මාව සෙල්ලම් කරන්න ගන්නෙත් නැහැ." මම එයාට කිවුවා "ඇයි ඔයා එයාලත් එක්ක රංඩු කරන්නේ, එයාලට කරදර කරන්නේ? අපේ පන්තියේ ළමයි එහෙම රණ්ඩු වෙන්නෙ නැහැ. ඒකයි ඔයත් එක්ක කවුරුත් කතා කරන්නේ නැත්තේ." පියුමි මගේ දිහා දුකෙන් බලාගෙන හිටියා. "ඔයත් මාත් එක්ක තරහා වෙලා හිටියා නම් මට කවුරුත් නැති වෙනවා නේද?" කියලා පියුමි කිවුවා. මම කිවුවා "ඔයත් හොඳ යහළුවෙක් වෙන්න." කියලා.

දවස් දෙකක නිවාඩුවකින් පස්සේ පියුමි පාසල් ආවා. එදා එයා ඇත ඉදලාම "ගුඩ් මෝර්නින්" කිවුවා. හැමෝම පුදුම වෙලා බලාගෙන හිටියා. සමහර යහළුවෝ අහක බලා ගත්තා.

මම කිවුවා "දැන් පියුමි හොඳ කෙනෙක්. අපි එයත් එක්ක යාළු වෙමු" කියලා. වෙනදාට වැඩිය පියුමි යාළුවන්ට උදවු කළා. ගුරුතුමියටත් උදවු කළා. කලින් කරපු කිසිම වරදක් එයා කළේ නැහැ. හොඳම හොඳ යාළුවෙක් වුණා. තරහා වෙලා හිටිය හැම යහළුවෙක්ම එයත් එක්ක යාළු වුණා. හැබැයි පියුමි එක වරදක් කළා. වැඩිපුරම පන්තියෙන් එළියේ ඉන්න තමයි එයා කැමති වුණේ. හැම තිස්සෙම ගුරුතුමි අපෙන් අහන්නේ ."පියුමි එළියට ගියා නේද? එක්කරගෙන එන්න" කියලා. මම ඇහැවුවා ."ඇයි ඔයා නිතරම එළියෙ ඉන්නෙ?" කියලා. එයා කියනවා ."මට ගෙදර සෙල්ලම් කරන්න කවුරුත් නෑ. අපිට සෙල්ලම් කරන්න මිදුලක් නෑ. මම ආසයි එළියෙ සෙල්ලම් කරන්න."

මට එයා ගැන එදා තවත් දුක හිතුණා. ඇත්තටම එයා මට හොඳම හොඳ යාළුවෙක් වුණා.

අම්මා නිතරම මට කියනවා වගේ හැමෝගෙම පුංචි හරි හොඳක් තියෙනවා.

හොඳ දේවල් ගැන නිතරම කිවුවම නරක කෙනෙක් වුණත් හොඳ කෙනෙක් කරන්න පුළුවන් කියලා මටත් දැන් නම් තේරෙනවා. ඒකට මට උදවු කළේ අපේ පන්තියට ආව අලුත් යාළුවා.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රඥා මුද්‍රණාල මවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්